ඩාබිඳු සාමූහික සංගමය
டாபிந்து கூட்டு ஒன்றியம்
DABINDU COLLECTIVE UNION

**<u>කාර්මික අර්බුදය හමුවේ කම්කරු කාන්තාවන්ගේ රැකියා සුරක්ෂිතභාවය ආරක්ෂා කරන</u>**

**<u>කම්කරු දිනය 2025 - කිලිනොච්චිය</u>**

**<u>ඩාබිඳු සාමූහික සංගමයේ කම්කරු දින ප්‍රකාශය</u>**

වසර හතළිහක් පුරාවට ඩාබිඳු සාමූහිකය නිදහස් වෙළඳ කලාපයේ සහ ඉන් පිටත ඇති ඇඟළුම් කම්හල්වල සේවයේ නියුතු කම්කරු කාන්තාවන් උදෙසා ඔවුන් හා එක්ව සටන් කරන්නෙමු. පසුගිය වසර හතර පටන් ඇඟළුම් ක්ෂේත්‍රයේ කම්කරුවන් වෘත්තීය සමිතිගත කිරීමේ ක්‍රියාවලියේ අප නිරිත වන්නේය. මෙහි දිගුවක් ලෙස 2025 කම්කරු දිනය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පැවැත් වෙන්නේ අප සංවිධානය කරනු ලබන කම්කරුවන්ගේ අධිෂ්ඨානය නිසාවෙනි.

1970 අග භාගයේ සිට නව ලිබරල් ප්‍රතිපත්ති යටතේ ශ්‍රී ලංකාවේ අපනයන ඇඟලුම් කර්මාන්තවලට ඇදී ආ කම්කරුවන්- විශේෂයෙන් කාන්තාවන්, මුහුණ දෙන ගැඹුරු අවදානම් තත්ත්වය 2025 කම්කරු දිනයේදී අපි පුනර්වාචනය කරන්නෙමු. ණය අර්බුදයක් මධ්‍යයේ, බහුලව කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ලංකාවේ විශාලතම විදේශ විනිමය ප්‍රභවයන්ගෙන් එකක් වන ඇඟළුම් කර්මාන්තයේ අස්ථාවරත්වය උග්‍රව පවතී. ගෝලීය සැපයුම් දාමයන් නිර්මාණය වනුයේ ශ්‍රී ලංකාව වැනි රටවල් ධනවත්, බලවත් ගෝලීය උතුරේ අවශ්‍යතා මත යැපීමටයි. ඒ වෙනුවට, අපගේ ප්‍රජාවන් සහ අපට ජීවය දෙන මහ පොළොව වෙනුවෙන් නිෂ්පාදනය සහ ප්‍රතිනිෂ්පාදනය කරන සහ ඒවා රැකබලා ගන්නා ආර්ථිකයක් වෙනුවෙන් සටන් කිරීමට අපි ඇපකැප වී සිටින්නෙමු.

බලවත් ආර්ථිකයන් මෙහෙයවන ගෝලීය ආර්ථික අර්බුදයන් තුළ, ශ්‍රී ලංකාව වැනි රටවල කම්කරුවන්, ගොවීන්, ධීවරයින් ඇතුළු වැඩ කරන පන්තිය අර්බුදයන්හි වැඩි බර දරන්නේ ය. 2008 ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු, ශ්‍රී ලාංකික සේවා යෝජකයින් දින 5 වැඩ සතිය හඳුන්වා දුන් අතර, කම්කරු නීති සංශෝධනයකින් තොරව පැය 9ක වැඩ දින සාමාන්‍යකරණය කළහ. 2020 කෝවිඩ් වසංගත තුළ, සේවා යෝජකයින් ඇඟළුම් කම්හල් අත්‍යවශ්‍ය සේවා ලෙස නම් කර, වැඩ කරන කාලයට කිසිදු අඩුවක් නොකර, කම්කරුවන්ට අර්ධ වටුප් ලබා දුන්හ. 2022 අර්බුදයෙන් පසුව, කම්කරු නීති ප්‍රතිසංස්කරණ හරහා කම්කරු ආරක්ෂණයන් දුර්වල කිරීමට නම්‍යශීලී වැඩ ගෙන ඒමට සේවා යෝජකයින් තැත් කළහ. 2025 අප්‍රේල්, ඇමරිකානු ජනපති ට්‍රම්ප්ගේ තීරුබදු නිසාවෙන් ඇඟළුම් ක්ෂේත්‍රයේ අස්ථාවරත්වය දරුණු වීමෙන්, කම්කරුවන්ගේ රැකියාවන් සහ අයිතිවාසිකම් කප්පාදු වීමේ අවධානමෙන් පෙළෙයි. රාජ්‍ය මෙවන් ප්‍රතිපත්තිවලට මග පාදයි.

අර්බුදයෙන් අර්බුදයට, බල අසමතුලිතතාවය තීව්‍ර වේ: සේවා යෝජකයින්ට සහන ලැබේ, කම්කරුවන්ගේ අයිතිවාසිකම් කප්පාදු වේ. මැයි දිනයේ පදනම තුළ, පැය 8 ක වැඩ දිනය, ඒ සඳහා ජීවන වැටුපක්, සේවක අයිතීන්, සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතීන් සහ රැකියා සුරක්ෂිතභාවය කොන්දේසි විරහිතව ශක්තිමත් කරන ලෙස අපි ඉල්ලා සිටිමු.

ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති සංවිධානය වීමේ නිදහස සෘජුවම උල්ලංඝනය කරමින් වෘත්තීය සමිතිගත වූ සේවකයින්ට හිරිහැර කිරීම, වෙනස් කොට සැලකීම සහ සේවයෙන් පහ කිරීම හරහා වෘත්තීය සමිති කඩාකප්පල් කිරීම ක්‍රමක්‍රමයෙන් දරුණු වෙමින් පවති. මෙම තත්ත්වය නිසාවෙන් අප උතුරේ කම්කරුවන්ගේ අනන්‍යතාවයන් ආරක්ෂා කරන කම්කරු දිනයක් සංවිධානය කිරීමට සිදු වී ඇත. වෘත්තීය සමිති අයිතිවාසිකම් ආරක්ෂා කරන නීති තිබියදීත්, මෙම නීති ක්‍රියාත්මක කිරීමට රජයේ ක්‍රියාමාර්ගවල අඩුවක් තිබේ.

No. 221, Welaboda Road, Katunayake, Sri Lanka.
Tel: +94 11 4 851 383 | Email: dabindu.infoco@gmail.com | Web: www.dabinducollective.org | Registration No - 9194

ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසාව සහ ප්‍රචණ්ඩත්වය ඇඟලුම් කර්මාන්තය තුළ සහ ඒ අවට කාන්තාවන් සහ LGBTQ+ පුද්ගලයින් සඳහා බහුලව පවතින ගැටලු වේ. මෙම ප්‍රචණ්ඩත්වය සේවා ස්ථානයෙන් ඔබ්බට යන අතර, රැකියාවට යන මග සහ බෝඩිම් නිවාස තුළත් අත්විඳිති.

නිවසේ වැටුප් නොලබන සුරැකුම් වැඩ කාන්තාවන්ට අසමානුපාතික ලෙස බර පටවන අතර, ඔවුන් අස්ථිර හා අවිධිමත් රැකියාවකට තල්ලු කරයි. නම්‍යශීලී වැඩ ප්‍රවර්ධනය කරන යෝජිත කම්කරු නීති අරමුණ වන්නේ කාන්තාවන්ගේ කාලය හා ශ්‍රමය තවදුරටත් සූරාකෑම මිස කාන්තාවන්ගේ බර අඩු කිරීම නොවේ.

මෙම මැයි දිනයේදී, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය සහ කුලය යනාදී සකලවිධ අනන්‍යතාවන් හේතුවෙන් අප අතර පවතින අසමානතා අනුදැක ඊට එරෙහිව සටන් කිරීමට අපි එක් වෙමු. ගෝලීය දකුණේ වැඩ කරන කාන්තාවන් අත්හැර දමා ඇති ගෝලීය පාලනාධිකාරියටත්, නව ලිබරල් රාජ්‍යයටත් අරගල කිරීමටත් අදිටන් කරගනිමින් අපි පහත ලබා දෙන ලෙස බල කර සිටිමු.

1. ගෝලීය ඇඟලුම් සැපයුම් දාම අර්බුදයෙන් බලපෑමට ලක්වන කම්කරුවන්ගේ රැකියා සුරක්ෂිතභාවය සහ අයිතිවසිකම් ආරක්ෂා කිරීමට;
2. ට්‍රම්ප්ගේ තීරුබදුවලට එරෙහිව කම්කරුවන් ආරක්ෂා කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීමට;
3. පැය 8 වැඩ දිනය ආරක්ෂා කිරීමට;
4. පැය 8 වැඩ දිනයට ජීවත් වීමට සරිලින වැටුපක් ලබා ගැනීමට;
5. නිෂ්පාදන ඉලක්කවලටත් ශ්‍රමයටත් සරිලන වැටුපක් ලබා ගැනීමට;
6. සෞඛ්‍යයට අහිතකර ලෙස බලපාන නිෂ්පාදන ඉලක්ක සහ නිෂ්පාදන ක්‍රම රාජ්‍ය විගණනයකට ලක් කර එය අඩු කිරීම හෝ වැළැක්වීමේ පියවර යොදවා ගැනීමට;
7. ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය ගැටලු වළක්වාලීමට සෑම පැයකටම වරක් වැසිකිළිය භාවිතා කිරීමටත් ජලය පානය කිරීමටත් විවේකයක් ලබා ගැනීමට;
8. සේවකයින්ගේ ශ්‍රමය සූරාකෑම සම්බන්ධයෙන් ජාත්‍යන්තර සන්නාම වගකීම භාර ගැනීමට;
9. ඇමරිකාවේ තීරුබදු ප්‍රතිපත්තියට මුහුණ දීමට කම්කරුවන් සුරක්ෂිත කිරීමත් සැළසුමක් සකස් කර ගැනීමට;
10. වැඩපොළේ සාධාරණ මුදලකට පෝෂ්‍යදායී ආහාරවේලක් ලබා ගැනීමට;
11. කම්කරුවන්ට ලෙඩ නිවාඩු සහ හදිසි අවස්ථාවල නිවාඩු ලබා ගැනීමට;
12. වැඩ ලෝකයේ ලිංගික සහ සමාජභාවය මත පදනම් වූ හිංසනයට හා ප්‍රචණ්ඩත්වයට නතර කිරිමට;
13. කම්කරුවන්ගේ වෘත්තීය සමිතිගත වීමේ, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ නිදහස කොන්දේසි විරහිතව ආරක්ෂා කිරීමට;
14. කර්මාන්තශාලා සහ සේවා ස්ථානවල දිවා සුරැකුම් පහසුකම්, දීර්ඝ කාලීන වැටුප් සහිත මාතෘ නිවාඩු සහ පීතෘ නිවාඩු වැනි කාන්තාවන්ගේ සුරැකුම් ශ්‍රමය වෙනුවෙන් ආධාරක ව්‍යුහයන් ලබා ගැනීමට;

15. සූරාකෑමට සහ වහල් සේවයට ඉඩ සලසන කම්කරු නීති හකුලා දැමීමට;
16. පැය 24 පුරා ක්‍රියාත්මක වන කාන්තා පොලිස් කාර්යංශය ස්ථාපිත කිරීමට;
17. සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය විසින් පවත්වනු ලබන සායනය සඳහා සතියක දිනයක් ලබා දෙන ලෙස කර්මාන්තශාලාවලින් ඉල්ලා සිටීමට;
18. රජය විසින් පවත්වාගෙන යනු ලබන ආරක්ෂිත නිවාස සහ වෛද්‍ය සායන හරහා කාන්තාවන්ට සහ LGBTQ+ පුද්ගලයින්ට වඩා හොඳ ආරක්ෂාවක් ලබා ගැනීමට;
19. සනීපාරක්ෂක තුවාවලට ගහන බදු අහෝසි කර සහනාධායී මිලට සනීපාරක්ෂක තුවා ලබා ගැනීමට;
20. IMF කප්පාදු වැඩපිලිවෙල, වැට් බදු සහ විදුලි/ගෑස් මිල බදු ඉහළ නැංවීම සහ රාජ්‍ය ආයතන විකිණීම වහාම නතර කිරීමට;
21. විදේශ ණය බර වැඩකරන ජනතාවට පැටවීම නවත්වා ජාත්‍යන්තර පෞද්ගලික බැඳුම්කර හිමියන්ට වගකීම භාර ගැනීමට බල කිරීමට;
22. අර්ථ සාධක අරමුදලේ පොළී කප්පාදුව සහ බදු අයකිරීම නැවැත් විමට;
23. අත්‍යවශ්‍ය සහනාධාර සහ නිදහස් සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපන පද්ධතියේ සම්පත් වැඩි කර මානව සංවර්ධනය වැඩි දියුණු කිරීමට;
24. වතු කම්කරුවන්ට ඉඩම්, නිවාස, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් දියුණු කර ගැනීමට;
25. කුඩා පරිමාණ ගොවීන්ගේ සහ ධීවරයන්ගේ ජීවනෝපාය ස්වෛරීභාවය ආරක්ෂා කර ගැනීමට;

අපි බල කර සිටිමු.

තීරුබදු තර්ජන සහ ඇඟළුම් ක්ෂේත්‍රයේ අස්ථාවරත්වය මධ්‍යයේ ඇමරිකාවට ඇඟලුම් නිෂ්පාදනය කරන කම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා ඇමරිකාවට ම ඇඟලුම් නිෂ්පාදනය කරන කිලිනොච්චි කම්කරුවන් හා එක්ව කම්කරු දිනය පැවැත්වීමට අපි තීරණය කළෙමු. එමෙන්ම කම්කරු දිනයේ පදනම තුළ විධිමත් සේවා ස්ථාන, කම්හල්, වතු, ගොවිබිම් සහ මුහුදු සීමාවන් ඉක්මවා යන කාන්තා ශ්‍රමය නැවත අවධාරණය කරන්නෙමු. අපි ජාත්‍යන්තර කම්කරු දිනය සමරන විට, වැටුප් නොලබන සුරැකුම් වැඩවල නිරත වෙමින් රටේ ආර්ථිකයේ බර උසුලන කාන්තා ශ්‍රමයේ බහුවිධ ස්වභාවය අපි සමරන්නෙමු.

**වැඩ කරන ජනතාවට ජය වේවා!**

**වැඩ කරන කාන්තාවන්ට ජය වේවා!**